


# හරි පුදුමයි

මම ඉපදුණේ කොළයක.
මම එළියට ආවේ පුංචි බිත්තරයකින්.



බඩගින්නක් ආවා. මම ටිකෙන් ටික කොළය කෑවා.

ඒත් බඩ පිරුණේ නෑ. මම තවත් කොළයක් කෑවා. ඒ විතරක් නෙවෙයි, රස ම රස මල් පොහොට්ටුත් කෑවා.



හොඳට ම බඩ පිරුණා. මට
නිදිමතක් දැනුණා. මම සිනිඳු
රෙද්දක් පෙරවා ගත්තා.

ඒකට කියන්නේ,
කෝෂය කියලා.



මම කෝෂය ඇතුළෙ
සති දෙකක් විතර හිටියා.

ඒ අතරේ මගේ ඇඟ
ටික ටික වෙනස් වුණා.



දවසක් මම
කෝෂයෙන්
එළියට ආවා.



මට මොකද වුණේ?
මම අලුත් වෙලා.
මගේ මුළු ඇඟ ම වෙනස් වෙලා.
මට හිතා ගන්න බෑ.
පාට පාට අත්තටු ඇවිල්ලා.
හරි පුදුමයි.

ඇත්තට ම මේ
මම ද?



මම වටපිට බැලුවා. සමනල්ලු අත්තටු සලමින් පියාඹනවා.
මමත් එයාලා වගේ කියලා මට හිතුණා.
මටත් දැන් පියාඹන්න පුළුවන්.

බඩගින්නක් දැනුණා. මම කොළයකට ළං වුණා.
ඒත් කොළ කන්න බෑ.

මම සමනලුන් දිහා බැලුවා.
එයාලා ඈතට පියාඹනවා.
මමත් එයාලත් එක්ක පියෑඹුවා.

පාට පාට මල් පිරිලා. ලස්සන මල් වත්තක්.



සමනල්ලු රංචුව මල්වලට ළං වුණා.
පැණි බොන්න පටන් ගත්තා.

මමත් මලක් උඩ වැහුවා.
පැණි ටිකක් බිව්වා.



මල් පෙති මගේ අත්තටු වගෙයි,
හරි ම සිනිඳුයි. ඒ වගේ ම පාට පාටයි.

දළඹු යාළුවෝ ටිකක් මම දැක්කා.
මම ළං වෙලා බැලුවා.
එයාලා මා හඳුනා ගත්තේ නෑ.

මම හුඟාක් වෙනස් වෙලා.

දැන් මම දළඹුවෙක් නොවෙයි, සමනලයෙක්.
මේ දළඹු යාළුවොත් දවසක ලස්සන සමනල්ලු වේවි.